සමාජ සවිබලගැන්වීම් හා සුබසාධන අමාත්‍යාංශය
சமூக வலுவூட்டல் மற்றும் நலனோம்புகை அமைச்சு
MINISTRY OF SOCIAL EMPOWERMENT AND WELFARE

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
வாழ்வின்எழுச்சி அபிவிருத்தி திணைக்களம்
**Department of Divineguma Development**

1වන අධියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.
1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல
1st 4th floor, **Sethsiripaya ,Battaramulla**

මගේ අංකය / எனது இல / **My No** – DDD/HO/04/Circular-2016
ඔබේ අංකය / உமது இல / **Your No** – ...........................
දිනය / திகதி / **Date** – 2016.05.25

**දිවිනැගුම චක්‍රලේඛ අංක :- 2016/07**

දිස්ත්‍රික් ලේකම්වරුන් / දිස්ත්‍රික් දිවිනැගුම අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂවරුන් වෙත.
මහනුවර / මාතෙල් / නුවරඑළිය / රත්නපුර/බදුල්ල/කෑගල්ල.

## වතු ප්‍රජාව ආශ්‍රිත අතිරේක ආදායම් උත්පාදන වැඩසටහන - 2016

**1. හැදින්වීම.**

වතු ආශ්‍රිතව ජීවත්වන අඩු ආදායම්ලාභී/ දිවිනැගුමලාභී ප්‍රජාවගේ ජීවන තත්වය නගා සිටුවීම සඳහා මෙම වසර තුල වැඩි අවධානයක් යොමු කිරීම මෙම වැඩසටහන මගින් සිදු කෙරේ.

**2. අරමුණු**

- නව ආදායම් උත්පාදන ව්‍යාපෘති බිහි කිරීම තුලින් වතු ප්‍රජාවගේ ආදායම් තත්වය ඉහළ නැංවීම.
- වතු නිවාස ආශ්‍රිත භූමිය ඵලදායී ලෙස යොදා ගැනීම.
- රැකියා අභිමුඛ පුහුණු වැඩසටහන් තුලින් තරුණ පිරිස් වලට නව රැකියා අවස්ථා ඇති කිරීම.
- වතු ආශ්‍රිතව විධිමත් වගාවන් ඇති කිරීම තුලින් පවුලේ පෝෂණ තත්ත්වය ඉහළ නැංවීම.
- ස්වයං රැකියා අවස්ථා බිහි කිරීම.

මේ යටතේ මෙම වසර තුල වතු ආශ්‍රිතව වැඩි ජනගහනයක් සිටින පහත සඳහන් දිස්ත්‍රික්කයන්හි සුදුසු ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කල යුතු වේ.

- මහනුවර
- මාතලේ
- නුවරඑළිය
- රත්නපුර
- බදුල්ල
- කෑගල්ල

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් / மேலதிக பணிப்பாளர்தலைமையதிபதி / Additional Director General | අධ්‍යක්ෂ (පාලන) / பணிப்பாளர் (நிர்வாகம்) / Director (Administration) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|
| Tel- | 011-2873802/2872202 | 011-2871672 | 011-2873799 | 011-2887280 |
| Fax - | 011-2889002 | 011-2887280 | 011-2873996 | 011- 2887722(Hotline) |

ඒ අනුව වතු ප්‍රජාවගේ ජීවන තත්වය නගා සිටුවීමට ඍජු දායකත්වයක් සපයනු ලබන පහත සඳහන් අංශ වලට අදාල ව්‍යාපෘතින් ක්‍රියාත්මක කිරීමට කටයුතු කල යුතු වේ. වතු අංශයේ ක්‍රියාත්මක කල හැකි ව්‍යාපෘති පිළිබඳව 2015 වසරේදී ඔබ විසින් හඳුනාගෙන මෙම දෙපාර්තමේන්තුව වෙත එවා ඇති යෝජනා එම වතු ප්‍රජාව සමග නැවත සමාලෝචනයට ලක්කර සුදුසු ව්‍යාපෘති හඳුනාගත යුතු වේ.

## 3. ක්‍රියාත්මක කල හැකි ව්‍යාපෘති

1. කෘෂි සංවර්ධන ව්‍යාපෘති
2. පශු සම්පත් ව්‍යාපෘති
3. ධිවර ව්‍යාපෘති
4. කර්මාන්ත හා ව්‍යවසාය සංවර්ධන ව්‍යාපෘති
5. රැකියා ඉලක්ක කරගත් වෘත්තීය පුහුණු වැඩසටහන්
   (උදා:- ෆැක්ටරි මැෂින් ඔපරේටර් / මෙකැනික් / කරණවැම්/ මේසන්/ ඉලෙක්ට්‍රික් / ඉලෙක්ට්‍රොනික්/ ලෝඩර් ඔපරේටර් / ලුහු ඉංජිනේරු)

හඳුනාගනු ලබන ව්‍යාපෘති තුලින් ප්‍රතිලාභීන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමට ඍජු දායකත්වයක් අනිවාර්යෙන්ම ලැබිය යුතු අතර ප්‍රදේශයට ගැලපෙන, තිරසාරභාවය තහවුරු වන, ව්‍යාපෘති පමණක් හඳුනා ගැනීමට සැලකිලිමත් විය යුතුය.

ව්‍යාපෘති ආරම්භ කිරීමට පෙර ප්‍රදේශයේ පවතින පාරිසරික විභවතාවයන් පිළිබඳ සැලකිලිමත් විය යුතුය. එමෙන්ම නිෂ්පාදන සඳහා පහසුවෙන් අලෙවි පහසුකම් ලගා කර ගත හැකි ව්‍යාපෘති කෙරෙහි අවධානය යොමු කර සුදුසු ව්‍යාපෘති තෝරා ගැනීමට උත්සුක විය යුතුය.

ව්‍යාපෘතිලාභියා හෝ පවුලේ සාමාජිකයින් රැකියාවෙහි නියැලෙන වතු භූමිවල ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති සම්බන්ධයෙන් අදාල වතු පාලනාධිකාරිය සමග සාකච්ඡා කොට ව්‍යාපෘති ආරම්භ කිරීමට පෙර පූර්ව එකඟතාවය ලබා ගැනීම අත්‍යාවශ්‍ය වේ.

## 4. ප්‍රතිපාදන සීමාවන්

ප්‍රතිලාභියාගේ පවුලේ ආර්ථීක හැකියාව පිළිබඳව සලකා බලා මෙම වැඩසටහන යටතේ ලබාදිය හැකි මූල්‍ය දායකත්වය තීරණය කළ යුතුය. රජයේ දායකත්වය මුළු ඇස්තමේන්තු මුදලෙන් 90% නොඉක්ම විය යුතු අතර රජයේ දායකත්වය එක් ව්‍යාපෘතියක් / එක් පවුලක් සඳහා රු 50,000 ට වැඩි නොවිය යුතුය. ප්‍රතිලාභී දායකත්වය දැරීමට ප්‍රමාණාත්මක ශක්තියක් නොමැති අවස්ථාවල ජීවනෝපාය චක්‍රිය අරමුදල මගින් එම මුදල ණයක් ලෙස ලබාදීමට කටයුතු කළ හැකිය.

ප්‍රතිලාභීන් හඳුනා ගැනීම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පරිපාලන වියදම් ආදී සියළු කටයුතු දිවිනැගුම චක්‍රලේඛ අංක 2016/4 පරිදි සිදු කල යුතු බව කාරුණිකව දන්වමි. එමෙන්ම එම චක්‍රලේඛයට අදාලව වතු අංශය ආශ්‍රිත ප්‍රතිලාභීන් තෝරාගෙන සිටීනම් ඔවුනට මෙම චක්‍රලේඛයට අදාල වන ව්‍යාපෘති සඳහා නැවත වරක් ප්‍රතිපාදන සලසා නොදිය යුතුය. තවද මෙම වතු අංශයට අදාලව භාවිතා කරන ඉහත කී චක්‍රලේඛය සමඟ ලබාදී ඇති සෑම ආකෘතියකම "වතු ප්‍රජාව සඳහා ජීවනෝපාය සංවර්ධන වැඩසටහන" යන්න පැහැදිළිව සඳහන් කල යුතුය.

## 5. මෙහෙයුම් ඇගයුම් ක්‍රියාවලිය

වතු ප්‍රජාව ආශ්‍රිත මෙවැනි ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති දියත් කිරීමේදී විධිමත් හා අඛණ්ඩ මෙහෙයුම් හා ඇගයුම් ක්‍රියාවලියක් අනුගමනය කිරීම අත්‍යාවශ්‍ය වේ. විශේෂයෙන්ම ප්‍රවේශ පහසුකම් ඉතා දුෂ්කර සහ වතු ආශ්‍රිතව හුදකලා වූ පරිසරයක ජීවත් වන වතු ප්‍රජාව සම්බන්ධයෙන් විශේෂ අවධානයක් සහිතව විධිමත් වැඩපිළිවෙලක් යටතේ කටයුතු කල යුතුවේ. ඒ අනුව  ක්‍රියාත්මක කරණු ලබන ව්‍යාපෘති සම්බන්ධයෙන් ඉතා සමීප අධීක්ෂණයක් සිදු කර අංක 2016/3 හා 2016.03.31 දින නිකුත් කර ඇති චක්‍රලේඛ උපදෙස් අනුගමනය කරමින් විධිමත් පරිදි ප්‍රගතිය වාර්තා කල යුතු වේ.

වතු ආශ්‍රිත අඩු ආදායම්ලාභී පවුල් වල ජීවන තත්වය උසස් මට්ටමකට පත් කර ගැනීමට සහාය වීම පිණිස මෙම වැඩසටහන් සාර්ථක කර ගැනීම සඳහා ඔබ ඇතුළු සියළු නිලධාරීන් දක්වන සහාය ඉතා අගය කරමි.

චන්ද්‍රා වික්‍රමසිංහ
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:-

1. සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන ගරු අමාත්‍ය එස්.බී දිසානායක මැතිතුමා - කා.දැ.ගැ.පි.
2. සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන ගරු නියෝජ්‍ය අමාත්‍ය රංජන් රාමනායක මැතිතුමා - කා.දැ.ගැ.පි.
2. සියළුම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු  සභාපතිතුමන්ලා - කා.දැ.ගැ.ස.
3. සියළුම ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සභාපතිතුමන්ලා - කා.දැ.ගැ.ස.
4. ලේකම්, සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස.
5. ලේකම්, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස.
6. අතිරේක ලේකම් (ග්‍රාමීය සංවර්ධන හා දිවිනැගුම), සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස.
7. විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.ස.
8. ප්‍රධාන ගණකාධිකාරි දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.ස.
9. ප්‍රධාන අභ්‍යන්තර විගණක, දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.ස.
10. සියළුම අංශ ප්‍රධානීන් , දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.ස.
11. සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් -කා.දැ.ගැ.ස හා අ.ක.ස
12. සියළුම දිවිනැගුම මූලස්ථාන කළමණාකරුවන් - අ.ක.ස හා දිවිනැගුම කළමණාකාර අධ්‍යක්ෂ - ව්‍යාපෘති / ප්‍රජා මූල බැංකු කළමණාකරුවන් සහ දිවිනැගුම සංවර්ධන නිලධාරීන් දැනුවත් කිරීම සඳහා